# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**

මගේ අංකය / எனது இல / My No: DSD/HO/6/EP/06/2020/ACP
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.02.12

*සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2020/04*

සියළුම දිස්ත්‍රික්ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ වරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම් වරුන් වෙත

**<u>සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2020</u>**

අඩු ආදායම් ලාභින්ගේ ජීවන තත්ත්වය තිරසාර ලෙස වර්ධනය කිරිම තුලින් දිවයිනේ ආර්ථික සංවර්ධනය ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරිම උදෙසා "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහනට සමගාමීව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන-2020 සැලසුම් කර ඇත. ඒ අනුව ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

ව්‍යවසාය සංවර්ධන වැඩසටහන-2020 මගින් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.

1. නව සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන 10 ක් ඉදි කිරිම
2. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය කිරිම හා ඉදිකිරිම් (අවිච්ඡේද වූ මධ්‍යස්ථාන)
3. සමෘද්ධි බොජුන්හල්වල ආහාර සැකසීමේ පුහුණු වැඩසටහන් (කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරිම)
4. දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම
5. සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා අන්තර්ජාලය භාවිතා කරමින් වෙලඳපල පුළුල් කිරිම හා සේවා සපයන වෘත්තිකයන් සඳහා අන්තර්ජාලය ඔස්සේ නව වෙළඳපොලක් බිහි කිරීම.
6. සමාජ ජාලා මගින් ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා මුහුණු පොතේ සමූහයක් නිර්මාණය කිරීම.(face book group)

1. **සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන 10 ක් ඉදිකිරීම**

සාර්ථකව පවත්වාගෙන යනු ලබන සමෘද්ධි සුව බොජුන්හල් වැඩසටහන සෞභාග්‍යයේ දැක්මට අනුව මෙම වසරේදී ද තවත් මධ්‍යස්ථාන 10 ක් ආරම්භ කිරීමට අපේක්ෂිතය. දැනටමත් එවැනි මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික්ක සඳහා මෙන්ම ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනු ලබන දිස්ත්‍රික්ක සඳහාද යෝජනා ඉදිරිපත් කළ හැක. මෙම වැඩසටහනට අදාල උපදෙස්, අංක DSD/HO/6/EP/2/SS/10 හා 2019.05.31 දිනැති ලිපිය මගින් දැනටමත් ඔබ වෙත යොමු කර ඇත.

2. **සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම හා ඉදිකිරීම් අවිච්ඡේද වූ මධ්‍යස්ථාන**

පසුගිය වර්ෂවලදී ඉදිකිරීම් ආරම්භ කර ඇස්තමේන්තු ප්‍රකාරව වැඩ අවසන් කර ඇති එහෙත් විදුලිය, ජලය, සනීපාරක්ෂක පහසුකම් ආදිය සම්පූර්ණ කර නොමැති දැනටමත් යෝජනා ඉදිරිපත් කර ඇති මධ්‍යස්ථාන සඳහා මෙන්ම ඉදිකිරීම් කටයුතු අවිච්ඡේද වී ඇති මධ්‍යස්ථාන සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

3. **සමෘද්ධි බොජුන්හල්වල ආහාර සැකසීමේ පුහුණු වැඩසටහන් (කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම)**

වස විස රහිත ආහාර පාන සැපයීම තුලින් සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ කාන්තාවන් තිරසාර ලෙස සවිබල ගැන්වීම මුඛ්‍ය පරමාර්ථය කරගනිමින් සමෘද්ධි සුව බොජුන්හල් වැඩසටහන ආරම්භ කර ඇත. එබැවින් මෙම ව්‍යවසායක කාන්තාවන් සඳහා ව්‍යාපාරික හික්මීමකින් යුතුව ආහාරපාන නිෂ්පාදනය හා අලෙවි කිරීම පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා දෙනු ලැබේ. මේ සඳහා සඳහා මීට පෙර අවස්ථා කිපයකදීම සේවය සලසන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ තාක්ෂනික සහාය හා උපදෙස් ලබාගැනීමට අදහස් කර ඇත.

4. **දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම**

සමෘද්ධි වැඩසටහන තුලින් ගොඩනැගුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපළ පුළුල් කරදීමේ අරමුණ ඇතිව දිස්ත්‍රික් වෙළඳ ප්‍රදර්ශන මෙම වසරේදීත් පැවැත්වීමට සැලසුම් කර ඇත. එය මෙවර **"සෞභාග්‍යා - 2020"** යන තේමා පාඨය මුල් කරගනිමින් පැවැත්විය යුතුය. සිංහල හා හින්දු අළුත් අවුරුද්ද, නත්තල් උත්සවය වැනි ජාතික උත්සව හෝ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් වශයෙන් වෙළඳපලක් ඇතිවන, වසරේ ඕනෑම අවස්ථාවක් ඉලක්ක කරගනිමින් ප්‍රදර්ශන සංවිධානය කළ හැකි අතර වෙළඳ ප්‍රදර්ශන සංවිධානය සඳහා මූලික උපදෙස් ඉදිරියේදී ඔබ වෙත ලබාදෙනු ඇත.

5. **සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා අන්තර්ජාලය භාවිතා කරමින් වෙලඳපල පුළුල් කිරීම හා සේවා සපයන වෘත්තිකයන් සඳහා අන්තර්ජාලය ඔස්සේ නව වෙළඳපොලක් බිහි කිරීම.**

සමෘද්ධි වැඩසටහන හා සම්බන්ධ නිෂ්පාදකයින් හා සේවා සපයන්නන් සඳහා මූලික ගැටළුවක් වන වෙළඳපල සොයා යැම සඳහා සහාය වීම මෙහි මූලික අරමුණ වේ. ඒ අනුව අන්තර්ජාල වෙළඳාමේ අතරමැදියන් ලෙස කටයුතු කරන ප්‍රමුඛ පෙලේ ආයතන සම්බන්ධ කරගනිමින් මෙම කාර්යය සිදුකරන අතර මෙහිදී අදාල ආයතන නියෝජිතයින් හා සමෘද්ධි ව්‍යවසායකයින් සම්බන්ධීකරනය කර ඔවුන්ගේ නිෂ්පාදිතයන් හා සේවා පිළිබඳ තොරතුරු නියොජිතයින්ගේ අන්තර්ජාල වෙළඳ අඩවි වල ප්‍රදර්ශනය කරනු ඇත. දැනටමත් "ඩරාස්(Daraz.lk)" හා "ඕනවැඩක් (Onwedak.lk)" යන ආයතන සමග අවබෝධතා ගිවිසුම් සිදුකර ඇති අතර ඉදිරියේදී ඔබගේ දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රාදේශිය ව්‍යාපාර

සංවිධානවල සහභගිත්වයෙන් ව්‍යවසායකයින් දැණුවත් කිරීම සඳහා අන්තර්ජාල වෙළඳ නියෝජිතයින් හා සම්බන්ධීකරය කිරීම ව්‍යවසාය සංවර්ධන අංශය මගින් සිවු කරනු ඇත.

6. **සමාජ ජාලා මගින් ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා මුහුණු පොතේ සමූහයක් නිර්මාණය කිරීම.(face book group)**

වර්ථමානයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම සමාජ ජාලා අඩවිය වන මුහුණු පොත තුල සමෘද්ධි ව්‍යවසායක සමුහයක් ගොඩනගමින් ඔවුන්ගේ නිෂ්පාදිත සඳහා නව වෙළඳපොලක් නිර්මාණය කිරිම මෙහි අරමුණ වේ.ව්‍යවසායකයින් මෙම සමුහයට ඇතුලත් කළ හැකි ආකාරය පිළිබඳ උපදෙස් ව්‍යසාය සංවර්ධන අංශය මගින් ලබා දෙනු ඇත.

<u>පොදු උපදෙස්</u>

01. ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජාවට ගැලපෙන ආකාරයට මෙන්ම ව්‍යවසායකයාගේ ව්‍යාපාරයේ තිරසාර බව තහවුරු වන ආකාරයට ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු අතර ඔහු /ඇය ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයෙකු බවට තහවුරුවක් ලබාගත යුතුය.

02. ව්‍යාපෘති සඳහා වන සියළු මිලදී ගැනීම් හා අනෙකුත් සියළු කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා ප්රසම්පාදන ක්‍රියාවලීන්ට අනුකූලව සිදුකළ යුතු බව අවධාරණය කෙරෙන අතර අදාල ආයතන හා දෙපාර්තමේන්තු නිර්දේශිත මිල ගණන් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමටද වගබලා ගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් පසුව මුදල් නිදහස් කිරීමට පියවර ගැනිම වඩාත් සුදුසු වේ.

03. ඉදිකිරීම් වලට අදාලව ආරම්භ කරනු ලබන ව්‍යාපෘති සියල්ල මෙම මුදල් වර්ෂය තුළ ඉදිකිරිම් අවසන් කළ යුතු අතර කිසිදු විටෙක ව්‍යාපෘති අවිච්ඡේද නොකළ යුතුය.

04. ව්‍යාපෘති අධීක්ෂණය, පසු විපරම් ක්‍රියාවලිය මෙන්ම ප්‍රගති සමාලෝචනයද, සමෘද්ධි ප්‍රජාමුල බැංකු සංගම් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුවිය යුතු අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතුය.

05. භාණ්ඩාගාර ඍජු ප්‍රතිපාදන යටතේ කේවල ව්‍යාපෘති සඳහා අනුමත කරන මුදල් නැවත අය කිරීමක් නොකෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා සත්‍ය වශයෙන්ම දරන වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා 1.5%ක් ද වනසේ පරිපාලන වියදම් වෙන් කරනු ලැබේ.

06. ප්‍රාදේශීය මට්ටමෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ඇමුණුම් අංක 01 ආකෘතියට අනුව සකස් කොට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

07. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ව්‍යාපෘති ලේඛනය සඳහා අවශ්‍ය වන අග්‍රිම ඇමුණුම 02 මගින් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට අග්‍රිම ලබා ගත යුතුය.

08. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 03 මගින් එළඹෙන මස 10 වන දිනට පෙර අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

09. ව්‍යාපෘතිවලට අදාල ප්‍රදර්ශන නාම පුවරු සමෘද්ධි ලාංඡනය සහිතව අනුමත වර්ණයන් යොදා සකස් කළ යුතුය.

බන්දුල තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

| | |
|---|---|
| 01. ලේකම්, කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | -කා.දැ.ගැ.පි |
| 02. රාජ්‍ය ලේකම් සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | -කා.දැ.ගැ.පි |
| 03. ප්‍රධාන ගණකාධිකාරී | -අ.ක.ස |
| 04. ප්‍රධාන අභ්‍යන්තර විගණක | -අ.ක.ස |
| 05. සියළුම අංශ ප්‍රධානීන් | -අ.ක.ස |